# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 72 — 1973 අගෝස්තු 10 වැනි සිකුරාදා — 1973.08.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පළකිරීම්


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1019 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | 1030 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 1027 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1027 | වෙන්දෙසි කිරීම පිළිබඳ දැන්වීම ... ... ... | — |
| තොවුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — | විවිධ දැන්වීම ... ... ... | 1030 |


## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 2) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

| සේවයන් | | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය |
|---|---|---|
| 1. මෙරට නිෂ්පාදිත නිල් ලෝම පීක් කැප් සැපයීම | — | 1973.09.04 |
| 2. මෙරට සාදන ලද හෝ මෙරට සවිකරන ලද බිත්ති ඔරලෝසු සැපයීම | — | 1973.09.04 |

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් පෝරම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 අගෝස්තු 10 දින,
කොළඹ දී ය.

8-459—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයන් පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා අපරභාග 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අන්වීක්ෂක (මයික්‍රස්කෝප්) සැපයීමේ ටෙන්ඩරය

කොළඹ 2, තැ. පෙ. 594, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 අගෝස්තු මස 29 දින පෙරවරු 10 තෙක් පහත සඳහන් අන්වීක්ෂක (මයික්‍රස්කෝප්) ලඟ ඇති තොගයෙන් සැපයීම සඳහා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

රෝහල් රසායනාගාරයන්හි පාවිච්චිය සඳහා අන්වීක්ෂක (මයික්‍රස් කෝප්) 2 යි

ටෙන්ඩර් පත් ලබා ගැනීමට ප්‍රථම මෙම මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත නැවත ලබාගත හැකි රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉදිරිපත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. 1973 අගෝස්තු මස 28 වෙනි දින තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැක.

සී. ඒච්. මැන්දිස්,
එයාර් කොමඩෝර්,
ගුවන් හමුදාධිපති.

8-439—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කුරුණෑගල බලවේග ආයතනයේ කම්බි දැල් ගැසීම සහ චිප් බෝඩ් සවිකිරීම සඳහා කොළඹ—1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973.08.30 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. සම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 5,000 කට හෝ ඊයට වැඩි මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත් කරුවන් විසින් රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට 1973.08.29 දින පෙ. ව. 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදින්චිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු : 3/1—(1/57).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973.07.28.

8-460 -73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගොඩනැගිලි ඉදිකිරීම—අනුරාධපුර, පුලියන්කුලමේ ගොවිපල් යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානය

පහත සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පේරාදෙනිය, කෘෂිකම් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 අගෝස්තු මස 31 වැනි දින පස්වරු 2 දක්වා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. මේ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර පේරාදෙනිය, කෘෂිකම් දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි) විසින් නිකුත් කරනු ලබන අතර, ඔහුගෙන් මේ සම්බන්ධ සැලසුම් හා වෙනත් විස්තරද ලබාගත හැකිය.

3. රජයේ දෙපාර්තමේන්තුවක රු. 2,00,000 වැඩි වටිනාකමකින් යුතුව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලියාපදින්චි කොන්ත්‍රාත්කරුවන්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකිය. එසේම ඔවුන්ට මෙම ගොඩනැගිලි මාස හයක් ඇතුළත නිමකොට භාරදීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය සහ කම්කරුවන් ලබාගැනීමේ පහසුකම් ඇත්තවුන් විය යුතුය. මෙම කාලය තුළ කෘෂිකර්ම අධ්‍යක්ෂ සෑහීමකට පත්වෙන අයුරින් නිමකළ නොහැකි කොන්ත්‍රාත්කරුවන් ඉල්ලුම් නොකළ යුතුය.

බීපී 7313—නේවාසිකාගාර දෙකයි.

බීපී 7314—කුස්සිය සහ කෑම ශාලාව.

4. පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ආකෘති පත් ලබාගත හැකි අතර, 1973 අගෝස්තු මස 29 වැනි දින ප.ව. 2.30 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරණු ලැබේ.

(i) තුන්වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ වාර්තාව හා අනෙක් අවශ්‍යතා ඔප්පු කරණ ලියවිලි.

(ii) ටෙන්ඩර් තැන්පත් වශයෙන් රු. 250 තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය.

5. ටෙන්ඩර් තැන්පත් පේරාදෙනිය, කෘෂිකම් දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක හෝ කොළඹ, යෝර්ක් වීදියේ ලංකා බැංකුවේ කෘෂිකම් අධ්‍යක්ෂගේ ගිණුම් අංක 37 ට හෝ තැන්පත් කළ හැකිය.

එල්. එස්. එස්. ජයසුන්දර,
කෘෂිකම් අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජූලි මස 10 වැනි දින,
පේරදෙණියේ, කෘෂිකම් දෙපාර්තමේන්තුවේ,
සිවිල් ඉංජිනේරු අංශයේ දී ය.

8-380—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### බඩු ප්‍රවාහනය කිරීම

රජයේ ගබඩා දෙපාර්තමේන්තුවේ සිට මරදාන තැපැල් සහ විදුලි සංදේශ ගබඩාවටත්, (ii) දුම්රිය පොළ, රේගුව හා විදුලි සංදේශ ගබඩාව අතරේ බඩු ප්‍රවාහනය කිරීමත්, (iii) කොළඹ හා සැතපුම් 15 ක් අවට පෙදෙස්වල බඩු ප්‍රවාහනය කිරීම හා (iv) දෙපාර්තමේන්තු කාර්යාල මාරු කිරීමේ දී, ඒවාට අදාල ප්‍රවාහන කටයුතු කිරීම සඳහාත්, කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ, ප්‍රදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973 අගෝස්තු මස 25 වැනි දින පෙරවරු 10 වන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. 1973 අගෝස්තුමස 25 වැනි දින පෙරවරු 10 ට ටෙන්ඩර්පත් විවෘත කරනු ඇත. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේ දී ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

3. කොළඹ 5, නාරහේන්පිට, සහකාර අධිකාරි (උපකරණ-ගොඩනැගිලි-සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් නිකුත් කරන ආකෘති පත්‍රවල ටෙන්ඩර් ෆෝර්ම ඉදිරිපත් කළ යුතුය.

4. කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරණ කවුළුවේ රු. 50 ක මුදලක් තැන්පත් කර රිසීට්පතක් ලබා ගෙන එම රිසිට් පත ඉදිරිපත් කළ විට, අවශ්‍ය ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. 1973 අගෝස්තු මස 10 වැනි දින සිට 1973 අගෝස්තු මස 24 වැනි දින පස්වරු 3.30 දක්වා ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

5. වැඩි විස්තර, කොළඹ 5, නාරාහේන්පිට, සහකාර අධිකාරි (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් ලබා ගත හැක.

ඩී. දයා කරුණාරත්න,
සහකාර පෝස්ට්මාස්ටර් ජනරාල් (තැපැල් සේවා).

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
ගත හැක.

8-495—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### එනමල් තීන්ත සැපයීම

ලී වලින් සාදන ලද ජනෙල්, දොරවල් යනාදියෙහි පිටතට සහ ඇතුළතට ගෑමට සුදුසු ඉක්මනින් වේලෙන තද ඔපය සහිත එනමල් තීන්ත සැපයීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1973.08.24 දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

ප්‍රමාණය :

| | | |
|---|---|---|
| තුනී අලුපාට (Flake or Slate Gray) ගැලුම් බ්‍රිතාන්‍ය සම්මිත වර්ණෝරුව 9-094 | ... | 200 |
| තද අලුපාට (Ash Gray) ගැලුම් බ්‍රිතාන්‍ය සම්මිත වර්ණෝරුව 9-096 | ... | 200 |

2. ටෙන්ඩර් කරුවන් විසින් සැපයීම කළයුත්තේ (ඒ) තිබෙන තොගයෙන් කිරුළපනයේ මධ්‍යම ගබඩාවට භාරදීමටත් ය. ටෙන්ඩර් කරුවන් විසින් භාරදිය හැකි ඉතාම නුදුරු කාල සීමාව සඳහන් කළ යුතුය.

3. 1973.08.23 වෙනි දින දවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝරමයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ, යෝර්ක් වීදියේ, ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරන ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පෝරම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. සියලු ටෙන්ඩර් කවරයන්හි වම් පස ඉහළ කෙළවරේ "එනමල් තීන්ත සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් පුද්ගලික නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනට භාරදිය යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාළ නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ආපසු ගෙන්වා ගත නොහැකිය.

7. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස්වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුයි.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුළත් වන්නේ ය.

9. කොළඹ. එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ දී 1973.08.24 වැනි දින පෙරවරු 11.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

11. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ, 1973 ජුලි 31.
සීපී/2/449.

8-492—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### මාතර දිස්ත්‍රික්කය තුළ, හොරේදොල-විටියලගොඩ-කිතුල්ඇල්ල වත්ත පාර තැනීම සඳහා ටෙන්ඩර්

ඉහත සඳහන් වැඩ සඳහා රුපියල් පනස් දහස (50,000) කට හෝ ඊට වැඩි වැඩ වෙනුවෙන් රජයේ දෙපාර්තමේන්තුවක ලියාපදිංචිව ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් සහ සමූපකාර කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති වලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සියළු ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව එක කවරයක බහා සිල් තබා, කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට එවිය යුතුයි.

3. ටෙන්ඩර්, ගාලු මුවදොර මහලේකම් කාර්යාලයේ 3 වැනි තට්ටුවේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතුයි. නො එසේ නම් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4. ටෙන්ඩර් පත්‍රය බහාලන ලියුම් කවරයේ මුදුනේ වම් කෙළවරෙහි "හොරේදොල-විටියලගොඩ කිතුල්ඇල්ලවත්ත පාරේ පළමු වැනි සැතපුම සඳහා වූ ටෙන්ඩර්" යයි ලියා 1973.09.07 වැනිදා පස්වරු 2.30 ට පෙර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලැබෙන සේ එවිය යුතුයි. එදින එම වේලාවේදීම ටෙන්ඩර් පත් විවෘත කරනවා ඇත. ටෙන්ඩර් කරුවන්ට ද එම වේලාවේදී පැමිණ සිටිය හැක.

5. 1973 සැප්තැම්බර් මස 4 වැනි දින දවල් 12 දක්වා මාතර දිසාපති කාර්යාලයෙන් ටෙන්ඩර් පෝරම ලබාගත හැක. නියමිත පෝරමයේ ඉල්ලුම් නොකරන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ටෙන්ඩර් කරු විසින් එවන ටෙන්ඩර් පත්‍රයේ කරනු ලැබූ මැකීම්, කටුගෑම් හෝ පසුව වෙනස් කිරීම් ආදී සෑම ස්ථානයකම එහුගේ කෙටි අත්සන තැබිය යුතුයි.

7. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර රුපියල් 50 ක් මාතර දිසාපති කාර්යාලයේ තැන්පත් කර ඒ වෙනුවෙන් ලත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. ලියාපදිංචි කළ කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති යනාදිය මෙම මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් ය.

8. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දැන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම්පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10ක් ඇතුළත අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

9. ටෙන්ඩර් පිළිගත් බවට යැවෙන දැන්වීම ටෙන්ඩර්කාරයා විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ ලිපිනයෙන් අදහස් කරන ස්ථානයෙහි තබනු ලැබුවහොත් ඒ දැන්වීම ටෙන්ඩර් කාරයාට ලැබුණාක් මෙන් සලකනු ලැබේ. ගිවිසුම් පත අත්සන් කිරීමෙන් පසුව අනික් සියළු තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

10. තෝරාගත් ටෙන්ඩර්කරු නියම කරන ලද කාලසීමාවක් තුළ නිසි අන්දමට වැඩ කරන බවට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක මුදලක් තැන්පත් කරන ලෙස මාතර දිසාපති විසින් දැනුම් දෙනු ඇත. ලියාපදිංචිවූ කම්කරු සමිති, විවිධසේවා සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති මෙම ඇප තැබීමෙන් නිදහස් ය.

11. ටෙන්ඩර්වලින් කොටසක් හෝ සියල්ලම ප්‍රශ්නකිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරයකින් කොටසක් භාර ගැනීම මුළුමනින්ම රජය කෙරෙහි පවත්නේ ය.

12. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයේ නම් ඇතුළත් කොන්ත්‍රාත්කරුවන් ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

ඩී. ඩබ්ලිව්. සී. ද සිල්වා,
මාතර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1973.07.26 දින,
මාතර කච්චේරියේ දී ය.

8-491—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

**තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව**

රබර් මුද්‍රා සැපයීම

රබර් මුද්‍රා සැපයීම සඳහා කොළඹ, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973 අගෝස්තු මස 25 වැනි දින පෙ. ව. 10 වන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. 1973 අගෝස්තු මස 25 වැනි දින පෙ. ව. 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ඇත. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේ දී ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

3. කොළඹ 5, නාරාහේන්පිට, සහකාර අධිකාරි (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් නිකුත් කරන ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරණ කවුළුවේ රු. 50 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබා ගෙන, එම රිසිට් පත ඉදිරිපත් කළ විට අවශ්‍ය ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. 1973 අගෝස්තු මස 10 වැනි දින සිට 1973 අගෝස්තු මස 24 වැනි දින සවස 3.30 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

5. වැඩි විස්තර, කොළඹ 5, නාරාහේන්පිට, සහකාර අධිකාරි (උපකරණ ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් ලබා ගත හැක.

වී. දයා කරුණාරත්න,
සහකාර පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි
සංදේශ අධ්‍යක්ෂ (තැපැල් සේවා).

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1.

8-494—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

යොමුව : පී.ඇස්. සී. 2/10/73

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

ජිප්සෝනා ප්ලාස්ටර් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ජිප්සෝනා ප්ලාස්ටර් සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(i) විදේශීය රටවල නමගිය නිපදවන්නෝ,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්.

2. සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ.පෙ. 584 හිමි කොළඹ 10, 385, ඩීන්ස්පාර දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973.09.04 දින පෙරවරු 10.00 තෙක් භාර ගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ,

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම් වලින් ;

(ii) ලංකාවේ විදේශ ආණ්ඩුවල නියෝජිතයින්.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උප ලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, ඩෙන්මාර්ක්, ස්විට්සර්ලන්තය ආදී රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබා ගන්නා ලෙස ඒජන්ට්වරු සහ නියෝජිතයින් විදේශීය සමාගම් වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

ඇන්. කේ. පී. විජේසිංහම,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, 1973.07.26.

අදාල උපලේඛනය

**SCHEDULE REFERRED TO**

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1. | Gypsona Plaster of Paris Bandages 4″ × 3 yards | 60,000 rolls | In Air-tight Tins |
| 2. | Gypsona Plaster of Paris Bandages 6″ × 3 yards | 60,000 rolls | do |

8-385—73.08.10 දින අංක 72 දරන ගැසට් පත්‍රය

---

**අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව**

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, පිහිටි ප්‍රවාහන අංශයේ ඇති පාවිච්චි කළ නොහැකි ටයර් හා ටියුබ් විකිණීම සඳහා කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 අගෝස්තු මස 31 දින ප. ව. 2 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර නම් කච්චේරියකට රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් 1973 අගෝස්තු මස 31 දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබාගත හැක.

වැඩි විස්තර ඉහත ලිපිනයේ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් ලබා ගැනීමට පිළිවන.

සී. ඩී. ප්‍රනාන්දු,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1973 ජූලි මස 31 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

8-498—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

### සුරාබදු දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා, කොළඹ 1, සුරාබදු දෙපාර්තමේන්තුවට පානීය පරිපාක ස්පිරිත්තු ගැළුම් 6,00,000ක් සැපයීම සඳහා වූ ටෙන්ඩරය**

පානීය පරිපාක ස්පිරිත්තු ඉම්පීරියල් ගැළුම් 6,00,000 ක් සැපයීම සඳහා ශ්‍රී ලංකා, කොළඹ 1, තැ. පෙ. 500, මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 සැප්තැම්බර් මස 25 වෙනි දින පෙරවරු 10.00 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, 1 වෙනි මාලයේ පිහිටි සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන් ලබා ගත හැකි නියමිත පෝර්ම පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳ සියළුම තොරතුරුද එම කාර්යාලයෙන් ලබා ගත හැක.

3. කච්චේරියක හෝ කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ පළමු වෙනි මහලේ සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන් හෝ රු. 100 ක තැන්පත් මුදලක් තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීම පිට 1973 සැප්තැම්බර් මස 24 වන දින දහවල් 12.00 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

හේ. බ. විජේකෝන්,
සුරාබදු කොමසාරිස්.

සුරාබදු කොමසාරිස් කාර්යාලය,
1වෙනි මහල,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973. 08. 01.

8-360—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යානය—දෙහිවල

පහත දැක්වෙන සත්වාහාර වර්ග සැපයීම සඳහා එව්නු ලබන සිල් තැබූ ටෙන්ඩර් පත්‍ර දෙහිවල, ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 අගෝස්තු මස 30 වැනි දින පෙරවරු 10.00 වන තුරු භාරගනු ලැබේ.

1. එලවළු, පලතුරු හා විවිධ ආහාර වර්ග.

2. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී එහි සිටීමට ටෙන්ඩර් කරුවන්ට ඉඩ දෙනු ලැබේ. ඉහත 1 වැනි ඡේදයේ සඳහන් කල දින හා එකී වේලාවට, දෙහිවල, ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යානයේ අධ්‍යක්ෂකගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

3. දෙහිවල, ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යානයේ අධ්‍යක්ෂකගෙන් 1973 අගෝස්තු මස 29 වැනි දින ප. ව. 3.00 වනතුරු ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් ඉදිරිපත් කල යුතුය.

4. හැම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් සමන්විත විය යුතු අතර, ටෙන්ඩර් බහා එවන කවරයේ ඉහල වම් කෙලවරේ "එලවලු හා පලතුරු ආදිය සඳහා ටෙන්ඩර්" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

5. ලියා පදිංචි තැපෑලෙන් ටෙන්ඩර් එවිය හැකිය. එසේ නැත හොත් දෙහිවල, ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යානයේ අධ්‍යක්ෂගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් තැන්පත් කල හැකිය. ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් ඔවුන් කැමැත්තේ නම් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට හා එය ලැබුණු බැව් දැන්වීමට බලය ලබා සිටින, දෙහිවල ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යානයේ කාර්යාල සහකාර වෙත අතින්ම භාර දිය හැකිය. (ඉහත 4 වැනි ඡේදයේ සඳහන් කල තොරතුරු හා ටෙන්ඩර් කරුගේ නාම හා ලිපිනය කවරයේ පිට පැත්තේ සටහන් කල යුතුය.)

6. ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට පෙර ටෙන්ඩර් තැන්පත් වශයෙන් රු. 50 ක් (රුපියල් පණහක් පමණයි) මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට රිසිට් පතක් ඉදිරිපත් කල යුතුය.

7. දෙහිවල ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යානයේ අධ්‍යක්ෂ වෙත ලියා වැඩිමනත් විස්තර හා කොන්දේසි දැන ගත හැකිය.

ඩබ්ලිව්. එල්. ඊ. ද අල්විස්,
ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යාන අධ්‍යක්ෂ.

73. 07. 31 දින,
දෙහිවල, ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යානයේදිය.

8-527—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව—පිරිපහදු අංශය

**ද්‍රව ඛනිජ තෙල් වායු සේවා පොළ ගොඩනැගීම**

සපුගස්කන්ද තෙල් පිරිපහදුවෙහි ද්‍රව ඛනිජ තෙල් වායු සේවා පොළ සඳහා බිම මට්ටම් කිරීම හා මාර්ග, කාණු, බෝක්කු සහ ගොඩනැගිලි යනාදිය තැනීම සඳහා මෙසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

තෙල් පිරිපහදුවේ මුදල් අංශයේ රුපියල් 100 ක් තැන්පත් කිරීමෙන් (ආපසු ගෙවන්නේ ඉන් රුපියල් 75 ක් පමණි) පසුව ජ්‍යෙෂ්ඨ කාර්යාල ඉංජිනේරු තැනගෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

ටෙන්ඩර් භාරගනු ලබන්නේ 1973. 08. 20 වෙනි දින පස්වරු 2.00 දක්වා පමණි.

ජ්‍යෙෂ්ඨ කාර්යාලයීය ඉංජිනේරු තැන.

1973. 07. 20 වෙනි දින,
පිරිපහදු අංශය.

8-464—7.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

### පටපණුවන් ඇති කිරීමේ ලී තැටි 200 ක් සඳහා මිළ ගණන් පත් කැඳවීම

කොළඹ 7, 159, ධර්මපාල මාවතේ, සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ විසින් පහත සඳහන් විශේෂිත පට පණුවන් ඇති කිරීමේ ලී තැටි 200 ක් සඳහා 1973.08.25 වැනි දින පෙ. ව. 10.00 තෙක් මිළ ගණන් පත් භාර ගනු ලැබේ.

2. **පටපණුවන් ඇති කිරීමේ ලී තැටි පිළිබඳ විශේෂීකරණය.**—මෙම තැටි අඩි $3\times4$ ක් විය යුතු අතර, අඟල් $2\frac{1}{2}$ ක් උසට ඇති හතර පැත්ත අඟල් $\frac{1}{2}$ ක් ඝණ ඇති ලෑලි වලින් සකස් විය යුතුය. පතුල අඟල් $\frac{1}{2}$ ක් ඝණකම ඇති අඟල් 1 ක් පළල ලී පටි අඟල් $\frac{1}{2}$ ක් අතර ඇතිව තිබිය යුතුය. මෙම පටි තැටියේ අඩි 3 ක් දිග පැත්තට සමාන්තරව සවි කළ යුතුය. මෙම පටි වලටත් යටින් අඩි 4 පැත්තට සමාන්තරව දිවෙන තවත් අඟල් $\frac{1}{2}$ ක් ඝණකම හා අඟල් $\frac{1}{2}$ පළල ලී පටි හතරක් සවි කළ යුතුය. මේවායේ පහළ කෙළවර මඳක් රවුම් විය යුතුය. මෙයින් දෙකක් අඟල් $2\frac{1}{2}$ ක් උස ඇති ලෑලි සහිත පැතිවල කෙළින්ම යටින් තිබිය යුතු අතර, ඉතිරි දෙක අතර ඇති ඉඩ ප්‍රමාණය සමව තුනට බෙදෙන සේ සවි කළ යුතුය. කොන් සතරේම තුන් හුලස් ලී කැබලි වලින් තැටිය ශක්තිමත් කිරීම කළ යුතු අතර, මේ සඳහා $3\times4$ පැති වලට අඟල් 3 ක් බැගින් සිටින සේ මෙම ලී කැබලි සවි විය යුතුය.

මෙහි දී පාවිච්චි කරන ලී සියල්ල මෝරපු සපු විය යුතු අතර, ඒවා හොඳින් මට්ටම් විය යුතුය. සෑම සන්ධියක්ම හොඳින් හා ස්ථිර ලෙස සවි විය යුතු අතර, සෑම ඇණයක්ම ඉතා හොඳින් වැද්දිය යුතුය.

සාමාන්‍යයෙන් සම්පූර්ණ කරන ලද තැටියක් කෙන්ගල්ල, පල්ලෙකැලේ, ප්‍රධාන සේද මධ්‍යස්ථානයේ, ව්‍යාපාර කළමණාකරුගේ කාර්යාලයේ සිල් තබා ඇති ආදර්ශමත් තැටියට සමාන විය යුතු අතර, පටි සහිත පතුල පමණක් මෙහි සඳහන් විශේෂිත අන්දමට විය යුතුය.

3. පිටපත් දෙකක් සහිත මිළ ගණන් පත් මුද්‍රා තැබූ කවර වල එවිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ "පටපණුවන් ඇති කිරීමේ ලී තැටි සඳහා මිළ ගණන් පත්" යන්න සඳහන් කර, මිළ ගණන් පත් බාර ගන්නා අවසාන වේලාවට පෙර, කොළඹ 7, ධර්මපාල මාවතේ, සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ වෙත ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4. පල්ලෙකැලේ ප්‍රධාන සේද මධ්‍යස්ථානයට ගෙනැවිත් බාර දීමට එක් නැවියකට මිල ගණන් දැන්විය යුතු අතර, එය අකුරෙන් සහ ඉලක්කම් වලින් දැක්විය යුතුය.

5. සියලුම ඉදිරිපත් කිරීම් මිල ගණන් පත් බාර ගන්නා අවසන් දින සිට දින 30 ක් ඇතුළත කාල සීමාවක් පමණක් වලංගුවේ.

6. මිල ගණන් පත් බාර ගන්නා මිල ගණන් කරු විසින් සති 3 ක් ඇතුළත මෙහි සඳහන් අන්දමට නියමිත නැවි ප්‍රමාණය සපයන බවට පැහැදිලි, ස්ථිරත්වයක් දැක්විය යුතුය. මිල ගණන් පත් බාර ගත් බවට මිල ගණන් කරු වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබේ.

7. ප්‍රශ්න කිරීමකින් තොරව, මිල ගණන් පත් පිළිගැනීම හෝ කොටසක් පිළි ගැනීම හෝ නොපිළිගැනීමේ බලය රජය සතුය.

ඊ. ජයනෙත්ති,
සුළු අපනයන බෝග අධ්‍යක්ෂ.

සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව,
159, ධර්මපාල මාවත,
කොළඹ 7.
1973.07.26.

8—482—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ටෙන්ඩර් දැන්වීමයි

### සුදු ඇම්. ඇෆ්. ප්‍රවෘත්ති මුද්‍රණ කඩදාසි සහ බ්ලීච්ඩ් මෙකැනිකල් මුද්‍රණ කඩදාසි සැපයීම සඳහා ටෙන්ඩරය

පහත සඳහන් කඩදාසි වර්ග සැපයීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

| | මෙට්රික් ටොන් |
|---|---|
| (1) රීල්වලින් යුත් සුදු ඇම්.ඇෆ්. ප්‍රවෘත්ති මුද්‍රණ කඩදාසි ... ... | 5000 |
| (2) ෂීට්වලින් යුත් සුදු ඇම්.ඇෆ්. ප්‍රවෘත්ති මුද්‍රණ කඩදාසි ... ... | 2500 |
| (3) රීල්වලින් යුත් බ්ලීච්ඩ් මෙකැනිකල් මුද්‍රණ කඩදාසි ... ... | 500 |
| (4) ෂීට්වලින් යුත් බ්ලීච්ඩ් මෙකැනිකල් මුද්‍රණ කඩදාසි ... ... | 500 |

1973 සැප්තැම්බර් 11 වෙනි දින ප. ව. 2 ට මිල ගණන් භාරගැනීම අවසන් කරනු ලැබේ. නියෝජිතයින් ගේ නාම සහ ලිපිනයන් සහිතව ලිඛිත අයදුම් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකිය.

වැ. බ. සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

තැ. පෙ. 1367,
356, යූනියන් පෙදෙස,
කොළඹ 2.

8-428—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

### විහරක සහ බදුරලියේ මධ්‍ය පේල් ක්‍රේප් කර්මාන්තශාලා සඳහා ගොඩනැගිලි ඉදිකිරීම, යන්ත්‍රෝපකරණ සැපයීම සහ සවිකිරීම

ඉහත සඳහන් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම 1973.8.27 වෙනි දින පෙ. ව. 11 තෙක් කල් දමා ඇත.

2. 1973 ජූලි මස 20 වන දින ගැසට් පත්‍රයේ පළ කර ඇති මෙම දැන්වීමේ 4(1) වෙනි ඡේදයේ ඇති 24″ × 14″ ප්‍රමාණයේ රෝලක් යන්න 26″×14″ ලෙස සංශෝධනය විය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර 1973.8.27 වෙනි දින පෙ. ව. 11.30 ට අගලවත්ත ඩාර්ටන් ෆීල්ඩ් හි ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ වරයා ගේ කාර්යාලයේ දී විවෘත කරන බව ටෙන්ඩර් අයදුම් කරුවන්ට දන්වන අතර එම වේලාවට පැමිණ සිටීමට අවසර ඇත.

අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය.

1973 ජූලි මස 31 දින,
ඩාර්ටන් ෆීල්ඩ්,
අගලවත්ත.

8-489—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කළුතර කොට්ඨාශය

### කිලිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර් කරුවන්ගේ සුදුසුකම්.**—1974 ජනවාරි මස 1 වෙනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වනදයින් (දින දෙකක් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිලිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කළුතර සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල.**—(I) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(II) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන්හෝ යාපනය, බදුල්ල, මඩකලපුව අනුරාධපුර, කොළඹ, ගාල්ල, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වව්නියා යන ස්ථානයන්හි පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලවලින් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරිමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි.

ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කම් විස්තර.**—සියළුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පෝර්ම් සඳහා ඉල්ලුම් කිරිමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, කළුතර'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ප්‍රාදේශීය ලේකම් මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ලබාගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය යුතුය.

6. **ටෙන්ඩර් පත්‍ර භාරගන්නාඅවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන් සහ ඔවුන් සඳහන් කරනල ද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කරගැනීම හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිත යෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකි ය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොන හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය පිළිගත් දින සිට දින 10 ක් ඇතුළත මෙහි පහත පෙනෙන උපලේඛන යෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් හැර, පිළිපැදිය යුතු ද වන්නේ ය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරි තුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපා ගනු ලැබේ.

(ii) **කිලිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහාමෙහා ගෙන යාමේ වියදම.**—යම් අවස්ථාවක කිලිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත්පාලන මණ්ඩලවල ඇති ආයතනයන්ට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර් කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවාට නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ යුතුය.

එච්. සී. ඌරගොඩ,
කළුතර සෞ. සේ. අධිකාරී.

කළුතර, සෞඛ්‍ය සේවා අධිකාරියේ දීය.
1973 ජූලි 25 වැනි දින.

### උප ලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) මසකට සේදිය යුතු වාර ගණන | (5) මසකට සේදිය යුතු කෑලි ගණන (සාමාන්‍ය) | (6) ටෙන්ඩර් භාරගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | | | |
| **කොටස "අ" ශල්‍යාගාරය, මාතෘ හා ළමා වාට්ටුව** ... | 50 ... | 400 ... | දිනපතා ... | 10,547 | 73.9.14 පෙරවරු 10 ට |
| **කොටස "ආ", "අ" කොටසේ සටහන් ඒවා හැර අනිකුත් සියලුම වාට්ටු හා චිකිත්සාගාර ආදිය** ... | 50 ... | 400 ... | 4 ... | 2,764 | |

8-381—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : එල්.එම්. 1505.

**මහනුවර දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ**

මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 1973.08.30 වැනි දින පෙරවරු 9.00 දක්වා මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර්පත් භාර ගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | ප්‍රා.ආ.නි. කොට්ඨාශය | ලියාපදිංචි විය යුතු මුදල රු. | ශ. |
|---|---|---|---|
| 1. දෙහිදෙනිය මල්වත්ත ජනපද පාරට ගල් අතුරා තාර දැමීම සහ කාණු 2ක් බැඳීම | යටිනුවර ... | 25,000 | 0 |
| 2. යහලතැන්න දිප්පිටිය වතුයායේ පූජාපිටිය කොටසේ පොදු ළිං | හාරිස්පත්තුව | 25,000 | 0 |
| 3. යහලතැන්න දිප්පිටිය ජනපදයට දෙල පිහිල්ල කොටසට නළ මඟින් ජලය සැපයීම | හාරිස්පත්තුව | 25,000 | 0 |
| 4. කිරිමැටිය ජනපද පාර තැනීම ... | කුම්පනේ ... | 25,000 | 0 |
| 5. උඩවෙල ජනපද නිලධාරි නිවාසයේ ටැන්කි අළුත්වැඩියා කිරීම —<br>උල්පතගම ජනපද නිලධාරි නිවාසයේ වතුර ටැන්කි අළුත් වැඩියා සහ දොරක් සවි කිරීම<br>උල්පතගම බෙහෙත් ශාලාව අළුත් වැඩියා කිරීම<br>හසලක ඩී2 ඇල අසල පිහිටා ඇති— ඉ.ක.ඕ. නිවාසය අළුත් වැඩියා කිරීම | මිනිපේ ... | 5,000 | 0 |
| 6. මොරයාය විශේෂ නිලධාරි නිවාසය සහ කාර්යාලය අළුත් වැඩියා කිරීම | මිනිපේ ... | 5,000 | 0 |

2. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමූපකාර සමිතිවලටද, රජයේ දෙපාර්තමේන්තුවල ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ටද 1973.08.24 වැනි දින දහවල් 12.00 තෙක් මහනුවර කච්චේරියේදී ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝරම අපේක්ෂකයින් විසින් ඉහත සඳහන් වැඩ වෙනුවෙන් රු. 25 මුදලක් මහනුවර කච්චේරියේදී තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මහනුවර දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමූපකාර සමිති ටෙන්ඩර් පෝරම සඳහා මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත් මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝරම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛන ගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ වම්පස උඩ කෙළවරේ වැඩයේ නම, ලියා තිබිය යුතුයි. ටෙන්ඩර් පෝරම ලේඛන ගත තැපෑලෙන් නොඑවන්නේ නම්, මහනුවර, කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි පැමිණ බහාලිය හැකිය.

5. 1973.08.30 වැනි දින පෙරවරු 9.00 ට මහනුවර කච්චේරියේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, එවැනි කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කරන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට අදාළ නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කම්කර්ම හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ එකඟත්වය ඇතිව නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව, ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කරන අතර, එවැන්නක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මෙ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන කම්කරුවන් සැම කොට්ඨාශයකටම සාධාරණ වූද කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන හා මින්පසු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූල වූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩං කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චෙක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් පරිදි බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත් කරු බැඳී සිටී.

7. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම් කළ විට මහනුවර දිසාපතිගෙන් ලබාගත හැකිය.

ඩී. බී. ගුණරත්නායක,
මහනුවර දිසාපති වෙනුවට.

1973 ජූලි මස 30 වැනි දින,
මහනුවර කච්චේරියේ දීය.

8–485—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## පුත්තලම් දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ සඳහා ටෙන්ඩර් කැඳවීම

පුත්තලම් දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 73.08.31 වැනි දින ප.ව. 2.30 දක්වා පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| වැඩයේ ස්වභාවය | ප්‍රා.ආ.නි. කොට්ඨාශය | ලියාපදිංචි වියයුතු මුදල රු. ශ. |
|---|---|---|
| 1. සං.වැ.අ. සඳහා කාර්යාල කාමරයක් තැනීම | පුත්තලම ... | 2,500 0 |

2. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිතිවලට ද රජයේ දෙපාර්තමේන්තුවල ඉහත සඳහන් වැඩ ඉදිකිරීම් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට ද 1973.08.28 දින දක්වා පුත්තලම කච්චේරියේ දී ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝරම අපේක්ෂකයින් විසින් පුත්තලම් කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ ඉහත ඇති වැඩවලට එක් එක් වැඩය වෙනුවෙන් රු. 25ක මුදලක් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් හා ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වී ඇති බවට සාධකයන් පුත්තලම දිසාපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පෝරම ලබාගත හැක. අනුමත කරනු ලැබූ සමිති ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් නිදහස්ය. එහෙත් ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන්ට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. චෙක්පත් මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ පුත්තලම දිසාපති වෙතින් ලබා ගත යුතු ආකෘති පත්‍ර මගින්, පිටපත් දෙකකින් යුක්තවයි. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවරේ "සංවර්ධන වැඩ අධිකාරි කාර්යාල කාමරය සඳහා ටෙන්ඩර් පත්‍රය", යනුවෙන් සඳහන් විය යුතු අතර සියලුම ටෙන්ඩර් පත්‍ර අත්සන තබා සීල්කර සුරක්ෂිතව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝරම ලේඛන ගත තැපැලෙන් නොඑවන්නේ නම් පුත්තලම දිසාපති කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි පැමිණ බහා ලියා හැකිය.

5. 1973.09.03 දින පුත්තලම දිසාපති කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට පැමිණ සිටිය හැක.

6. කිසිදු හේතුවක් නොදක්වා සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ ටෙන්ඩර් මණ්ඩලය සතුය.

7. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරයේ මුළු මුදලින් සියයට 5ක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුයි. එසේම ටෙන්ඩර්කරුට ටෙන්ඩරය පිළිගත් බව දැනුම් දීමෙන් දින 7ක් ඇතුලත දී වැඩ ගිවිසුමක් අත්සන් කිරීමට සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර් භාරගත් බව සඳහන් ලියවිලි ඔහුට පුද්ගලිකව භාරදීමෙන් හෝ ඔහු විසින් දී ඇති ලිපිනයට ලියා පදිංචි තැපැලෙන් යැවීමෙන් හෝ ඔහුට ඒ බව දන්වූ බව පිළිගැනෙනවා ඇත. එසේ දැනුම් දීමෙන් පසු ගිවිසුම් පත්‍ර අත්සන් තැබීම අතපසු කළහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් තැන්පත් මුදල රාජසන්තක වනවා ඇත. අසාර්ථක ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවීමට කටයුතු කරන්නේ පිළිගත් ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුදලින් සියයට 5ක මුදල් ඇප වශයෙන් තැන්පත් කළ පසුය.

8. මෙම කොන්ත්‍රාත් කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟවිය යුතු අතර, එවැනි කම්කරුවන් හැකිතාක් බඳවාගත යුත්තේ වැඩය කරන ප්‍රදේශයේ සිටින අය අතුරිනි. කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්නා හා මින්පසු ක්‍රියාත්මක විය හැකි රෙගුලායිවලට අනුකූල වූ වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

9. වැඩි විස්තර පුත්තලම දිසාපති වෙතින් ලබාගත හැකිය.

බ. සු. විජේවීර,
පුත්තලම දිසාපති.

1973.07.30 වැනි දින.

8–486—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය—උතුරු මැදි දිශාව

### ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මින්නේරිය කොට්ඨාශයේ පිහිටි පේකුලම් වැව වැඩිදියුණු කිරීම සඳහා වෙන් වෙන් වශයෙන් වූ සීල් තබන ලද ටෙන්ඩර් පොළොන්නරුවේ දිස්ත්‍රික් වැඩ අධ්‍යක්ෂ තැන විසින් 1973 සැප්තැම්බර් මස 4 වැනි දින පෙරවරු 10.00 දක්වා භාරගනු ලැබේ.

2. පහත සඳහන් ගණන්වලට හෝ ඊට වැඩි ප්‍රමාණයන්ට රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ආදියට මේ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

| ටෙන්ඩර් අංකය | වැඩ විස්තර | ලියාපදිංචිවී තිබිය යුතු මුදල රු. ශ. | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. |
|---|---|---|---|
| පි/1/73 ... | විෂය අංක (I) ප්‍රධාන වැව් බැම්මේ පස් වැඩ ... ... ... | 70,000 0 ... | 100 0 |
| පි/2/73 ... | විෂය අංක (II) කැඩුම්කඩ පිරවීමේ බැම්මේ පස් වැඩ ... ... ... | 2,55,000 0 ... | 250 0 |
| පි/3/73 ... | විෂය අංක (III) වාන ඉදි කිරීම ... ... ... ... | 1,55,000 0 ... | 200 0 |
| පි/4/73 ... | විෂය අංක (IV) පිවිසුම් මග ඉදිකිරීම ... ... ... ... | 75,000 0 ... | 100 0 |

3. ටෙන්ඩර් පත් ඉල්ලුම් කිරීමේදී කොන්ත්‍රාත්කරුවන් විසින් තමන්ගේ ලියා පදිංචි පොත් හා දැනට ඔවුන් රජය යටතේ කරනු ලබන කොන්ත්‍රාත් වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා විධායක ඉංජිනේරු තැන වෙත

ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබීමට පෙර එක් එක් ටෙන්ඩරය වෙනුවෙන් ඉහත දක්වා ඇති පරිදි විධායක ඉංජිනේරු කාර්යාලයේ මුදල් තැන්පත් කළ යුතුයි. එසේ නැතහොත් ලංකාවේ ඕනෑම කච්චේරියක එසේ මුදල් තැන්පත් කර ඇති බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

(අ) ටෙන්ඩර් පත් අත්සන් කර, දතම යොදු සීල් තබන ලද කවර වල බහා පිටපත් දෙකකින් යුතුව පොළොන්නරුවේ දිස්ත්‍රික් වැඩ අධ්‍යක්ෂ වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. එසේ නැතහොත් එම කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලිය යුතුය. කවරයේ වම් ඉහළ කෙළවරේ ''ජේකුලම් වැවේ වැඩ සඳහා ටෙන්ඩර්'' යනුවෙන් සඳහන් කළ යුතුය.

4. මෙම ටෙන්ඩර් සම්බන්ධයෙන් වූ වැඩි විස්තර වැඩ කරන වේලාවන් තුළදී මින්නේරිය විධායක ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

5. මෙම ටෙන්ඩර් විවෘත කරනු ලැබූ දින සිට මාස 5ක් දක්වා වූ කාලයක් වලංගුව පවතිනු ඇත.

ඒ. තාවකුරෙයි,
විධායක ඉංජිනේරු—මින්නේරිය කොටස.

විධායක ඉංජිනේරු කාර්යාලය,
මින්නේරිය කොට්ඨාශය,
හිඟුරක්ගොඩ,
1973 ජුලි 27.

8-493—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම්

**1971.01.01 දින සිට අද දක්වා ලැබුන ටෙන්ඩර්වල ප්‍රතිඵල—ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු, උ.මැ.දි, අනුරාධපුරය**

| අංක | සේවය | ටෙන්ඩර් පියවූ දිනය | ලද මුළු ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය | පිළිගත් ටෙන්ඩර් මුදල |
|---|---|---|---|---|---|
| 1... | ප්‍රවාහන කුලියට පස් ඉවත් කිරීම උපකරණ ආදිය | 15.08.72 ... | 5 | ... අවලංගු කරන ලදී. නැවත ටෙන්ඩර් කැඳවනවා ඇත | — |
| 2 ... | හිස් තාර පීප්ප වාන බැරල්, සිමෙන්ති උර සැපයීම සඳහා ටෙන්ඩර් | 10.10.72 ... | 3 | ... ජේ. ජේ. තිවියනාදන්, පැලියගොඩ ... | රු. 7 හිස් වාන බැරල් එකක් රු. 5.87 තාර පීප්ප එකක් |
| 3 ... | මහඉලුප්පල්ලම වැව වැඩි දියුණු කිරීම | ... 13.12.72 ... | 1 | ... අවලංගු කරන ලදී ... ... | ටෙන්ඩර් ගණන වැඩි නිසා |
| 4 ... | (අ) කොහොම්බගස්කඩ වැඩි දියුණු කිරීම | 12.06.73 ... | 3 | ... වී. රෙයිට්න්අප්පු, මහපොතාන ... | රු. 44,359 |
| | (ආ) මැදවච්චිය වැඩි දියුණු කිරීම | ... 12.06.73 ... | 2 | ... කේ. ජී. සෝමදාස, පරන්ගියාවාඩිය... | රු. 67,115 |
| | (ඇ) කපුගොල්ලෑව-වාගොල්ලෑකඩ පාර... | 12.06.73 ... | 2 | ... ආර්. සිරිදුරන්, ත්‍රිකුණාමලේ ... | රු. 31,600 |
| | (ඈ) කඩදෙකවැව ප්‍රතිසංස්කරණය | ... 12.06.73 ... | 3 | ... ඩී. කේ. විලියම් මහත්මිය, අනුරාධපුර | රු. 41,073.50 |
| | (ඉ) ඉහල දිවුල්වැව-ආනලොන්දව පාර වැඩි දියුණු කිරීම | 12.06.73 ... | 1 | ... ග්‍රා. ස. සමිතිය, හෙරත් හල්මිල්ලෑව | රු. 58, 527.50 |
| 5 ... | (අ) මහ තිඹිරි වැව වැඩි දියුණු කිරීම | ... 06.07.73 ... | 3 | ... එච්. බී. රත්නායක, කොළඹ 4 ... | රු. 29,793 |
| | (ආ) වරාවැව වැඩි දියුණු කිරීම | ... 06.07.73 ... | 3 | ... ඇන්. ඩබ්. අබේවර්ධන, තලුකඩවල | රු. 17,200 |
| | (ඇ) ගැටදිවුල්වැව වැඩි දියුණු කිරීම | ... 06.07.73 ... | 3 | ... එච්. බී. රත්නායක, කොළඹ 4 ... | රු. 34,207 |

ජී. ඇස්. වික්‍රමසිංහ,
වැඩ අධ්‍යක්ෂක. උ.මැ.දි.

1973 ජුලි මස වැනි දින,
වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
අනුරාධපුරයේදී.

8-371—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## බඩුබාහිරාදිය විකිණීම්

### වෙන්දේසියේ විකිණීමයි

(242 වැනි අධිකාරය වන) ආදායම් බදු ආඥා පනතේ 34 (2) (ඒ) දරණ වගන්තිය හා දේශීය ආදායම් පනතේ 110 (2) (ඒ) දරණ වගන්තිය අනුව මා වෙත නිකුත් කරන ලද අංක ඩී. 24/6003—9 දරණ බදු ගෙවීමේ පැහැර හැරීම පිළිබඳ සහතිකය යටතේ තහනම් කරන ලද, මෙහි පහත සඳහන් වාහන 1973 අගෝස්තු මස 22 වැනි දින පෙරවරු 10.00 ට යාපනයේ පිස්කල් කාර්යාල භූමියේදී (පැරණි මහ ලේකම් කාර්යාලය) ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඒවා මිළයට ගැනීමට බලාපොරොත්තුවන අයට, වැඩ කරන දිනවල කාර්යාලීය වේලාව තුළදී මෙම වාහන පරීක්ෂා කර බැලිය හැකිය.

විකුණන ලද වාහනය සඳහා වූ සම්පූර්ණ ලංසු මුදල සාර්ථක ඉල්ලුම් කරු විසින් ඒ අවස්ථාවේදීම මුදලින් තැන්පත් කළ යුතුය.

විකුණූ වාහනය, එසේ විකුණූ දින සිට පැය 24 ක් තුළ දී ඉවත් කර ගත යුතුය. වෙන්දේසියේ විකිණීම පැවැත්විය යුත්තේ, විකුණන විට ඒ ස්ථානයේදී කියවනු ලබන කොන්දේසිවලට යටත්වය.

පී. රාජසිංහම්,
උතුරු පළාතේ පිස්කල් වෙනුවට.

1973 ජුලි මස 27 වැනි දින,
යාපනය, පිස්කල් කාර්යාලයේ දී ය.

ඉහත සඳහන් වාහන පිළිබඳ විස්තර

මෝටර් රථය—පියට් 1800—4 ශ්‍රී 609—සේවයට සුදුසුය.

ලොරිය—ෂවලට්—33 ශ්‍රී 5095—සේවයට සුදුසුය.

8—418—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**පේරාදෙණියේ, ගන්නොරුවේ ඉංජිනේරු අංශයේ වැඩපළේ අප්‍රයෝජනවත් රථවාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

මෙහි පහත සඳහන් අප්‍රයෝජනවත් රථවාහන 1973 අගෝස්තු මස 31 වැනි දින පෙරවරු 9.30 ට පේරාදෙණියේ, ගන්නොරුවේ, ඉංජිනේරු අංශයේ වැඩපළේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රථවාහන

1. සිව් 3406 ... කොමර් ලොරිය.
2. සිව් 6949 ... ඉන්ටර් නැෂනල් වෑන්
3. සිව් 3571 ... කොමර් ලොරිය.
4. සිව් 3758 ... කොමර් ලොරිය.
5. සිව් 6706 ... ඉන්ටර් නැෂනල් පැසෙන්ජර් වෑන්.
6. සිව් 6777 ... ඉන්ටර් නැෂනල් වෑන්.
7. සිව් 3723 ... කොමර් ලොරිය.
8. සිව් 4866 ... ඉන්ටර් නැෂනල් වෑන්.
9. සිව් 4970 ... ඉන්ටර් නැෂනල් වෑන්.
10. සිව් 3754 ... කොමර් ලොරිය.
11. සිව් 3726 ... කොමර් ලොරිය.
12. සිව් 3411 ... කොමර් වෑන්.
13. සිව් 4865 ... ඉන්ටර් නැෂනල් වෑන්.
14. සිව් 6704 ... ඉන්ටර් නැෂනල් වෑන්.
15. සිව් 6950 ... ඉන්ටර් නැෂනල් වෑන්.
16. සිව් 3725 ... කොමර් ලොරිය.
17. සිව් 6701 ... ඉන්ටර් නැෂනල් වෑන්.
18. සිවයි 6110 ... ෆෝඩ් ලොරිය.
19. 33 ශ්‍රී 1288 ... ඉන්ටර් නැෂනල් ට්‍රැවලෝල් වෑන්.
20. 33 ශ්‍රී 469 ... ඉන්ටර් නැෂනල් ලොරිය.
21. 33 ශ්‍රී 2188 ... මොරිස් ලොරිය.
22. 33 ශ්‍රී 491 ... ඉන්ටර් නැෂනල් ලොරිය.
23. 33 ශ්‍රී 1270 ... ඩොජ් පවර් වැගන් (බොඩි රහිත).
24. 33 ශ්‍රී 489 ... ඉන්ටර් නැෂනල් ලොරිය.

2. මෙම රථවාහන 1973 අගෝස්තු මස 23 වැනි දින සිට 30 වැනි දින දක්වා සාමාන්‍ය වැඩ කරන වේලාව ඇතුලත ගන්නොරුවේ, ඉංජිනේරු අංශයේ වැඩපළේ, කෘෂිකර්ම ඉංජිනේරු තැන සමඟ සාකච්ඡා කර පරීක්ෂා කර බැලිය හැක.

3. ගැණුම්කරු විසින් එවේලේම සම්පූර්ණ වටිනාකම මුදලින් ගෙවා තමන් මිලයට ගත් රථවාහන එම ස්ථානයෙන් එදිනම ඉවත් කර ගත යුතුය. රථවාහන ඉන් පසු මෙම ස්ථානයේ තබා ගනු ලබන්නේ ගැණුම්කරුගේ වගකීම පිට ය.

4. ඉහත සඳහන් රථවාහන අවශ්‍ය වෙනත් රජයේ දෙපාර්තමේන්තු හෝ සංස්ථා 1973 අගෝස්තු මස 24 වන දිනට හෝ ඊට ප්‍රථම පරීක්ෂා කර බලා අවශ්‍ය දැ වෙන් කරවා ගැනීම හෝ ඉවත් කර ගන්නා ලෙස මෙයින් ඉල්ලමි.

5. දැනුම් දීමක් නොමැතිව මෙම රථවාහන අතරින් ඕනෑම එකක් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

එන්. කනේෂු,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

ගන්නොරුව, පේරාදෙණිය,
1973 ජූලි මස 25.

8-357—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

### රේගුවේ වෙන්දේසිය

පහත දක්වෙන භාණ්ඩ 1973 අගෝස්තු මස 22 වැනි දින, කොලඹ ශ්‍රී ලංකා රේගුවේ ගමන් බඩු කාර්‍යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. පෙ. ව. 9 ට වෙන්දේසිය ආරම්භ වෙයි. 1973 අගෝස්තු 21 වැනි දින පෙ. ව. 9 සිට දවල් 12 දක්වාත් ප. ව. 1 සිට ස. ව. 3.15 දක්වාත් භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා තබනු ඇත.

1. සික්වින්ස් පැකට් 50 ක් (දළ වශයෙන් රු. 50) වාත්තු ප්‍රින්ක් පෙට්ටියක් සමග.
2 සිට 9 දක්වා : සික්වින්ස් සහ පබළු වලින් වැඩ දැමූ කාන්තා ඇඳුම් 8 ක්.
10. බුප්පට බෝඩර් පැකට් 102 ක් ඇඳුම් බෑගය සමග.—(පිදි පාට 67 සි, රත්රන් පාට 35 සි.)
11. වේවැල් බෑගයක් සමග මදුරු දැල් 1 ක්.
12 සිට 15 දක්වා : කමිස 4 ක්.
16. සුදු රෙදි යාර ½ ක්.
17. කාන්තා කුඩ 1 ක්.
18. සිට 21 දක්වා : යාර 5½ කෘතිම ලේස් සාරි 4 ක්
22. තිස් ඇඳුම් බෑග (සූට්කේස්) 1 ක්.
23. අඟල් 1 ක් පලල කළු ලේස් යාර 7½ ක්.
24. රත්තල් 32 ක් පමණ බරැති සික්වින්ස් පැකට් 32 ක් සූට් කේසය සමග.
25. රත්තල් 8 ක් පමණ බරැති සික්වින්ස් පැකට් 29 ක්.
26. රත්තල් 1½ ක් පමණ බරැති ඉතා කුඩා සික්වින්ස් සහ සික්වින්ස් බෝල පැකට් 20 ක්.
27. එකක 5 බැගින් වූ '7 ඕ ක්ලොක්' බ්ලේඩ් තල පැකට් 80 ක් අඩංගු පෙට්ටි 4 ක්.
28. උපැස් යුගල 12 ක්.
29. ෂේද සාරි 1 ක්.
30. තිස් ඇඳුම් බෑග (සූට් කේස) 1 ක්.
31. යාර 1½ ක් දිග කෘතිම කලිසන් රෙද්දක්.
32. යතුරු ලියන මකන කෑලි 1435 ක්.
33. විදුරු මල් පෝච්චි 2ක්, ප්ලාස්ටික් මේස පලස් 5 ක්, කාන්තා සෙරෙප්පු කුට්ටමක්.
34. එකක 5 බැගින් වූ කාවුන 10 ක් අඩංගුවන විල්කින්සන් බ්ලේඩ් පැකට් 250 ක්.
35. කාන්දම් පටි (මැග්නටික් ටේප්) 1 ක්.
36. විදුරු මාල 5 ක්.
37. මෝටර් රථ අමතර කොටස් අඩංගු පැකට් 2 ක්.
38. "ඔලිම්පියා ඩි ලුක්ස්" වර්ගයට අයත් අතේ ගෙනයා හැකි යතුරු ලියනයක්.
39 සිට 40 දක්වා : පැල්ලම් වැටුන පිරිමි කමිස 2 ක්.
41 සිට 46 දක්වා : තිස් (සූට්කේස) ඇඳුම් බෑග 6 ක්.
47 සිට 50 දක්වා : තිස් ට්‍රන්ක් පෙට්ටි 4 ක්
51 සිට 52 දක්වා : (ජර්කින්ස්) උඩ කබා දෙකක්.
53. ළමා කමිස 1 ක්
54. ට්‍රාන්සිස්ටර් 12 යෝ තරංගමාලා 3, අංක ආර් 357 දරණ නැෂනල් ට්‍රාන්සිස්ටර් ගුවන් විදුලි යන්ත්‍රයක්
55. 'එරෝපා' වර්ගයට අයත් ගමන් ඔරලෝසු 1 ක්.
56. රත්තල් 9½ ක් පමණ බරැති පබළු මාල මිටි 10 ක්.
57. රත්තල් 6 ක් පමණ බරැති කළු සහ රතු කෘතිම ලේස් මිටි 6 ක්.
58. 'හීරෝ' වර්ගයට අයත් බයිසිකල් දම්වැල් 48 ක්.
59. ඉටිපන්දම් 300 බල—පැකට්වුවක ග්‍රෝස් ½ බැගින් වූ "ඉපා" වර්ගයට අයත් පැට්‍රොමැක්ස් පුඩු (නිපල්ස්) පෙට්ටි 12 ක්.
60. එකක 6 බැගින් වූ තාපදීප්ත ලාම්පු උඩ කොටස් පැකට් 12 ක්.
61. එකක ග්‍රෝස් 1 බැගින් අඩංගු ලාම්පු කොටස් රැගත් ප්ලාස්ටික් පෙට්ටි 6 ක්.
62. පෙට්ටිවල බහාලූ "සැම්සන් 333" වර්ගයට අයත් අගුළු 12ක් —යතුරු සමග.
63. "ටයිගර්" වර්ගයට අයත් විවිධ ප්‍රමාණයේ ශුබ් යතුරු 59ක් අඩංගු පෙට්ටි 6 ක්
64. "හීරෝ" වර්ගයට අයත් උල්පත් පෑන් 72 ක්.
65. අත්ලේන්සු 12 ක්.
66. පිලිප්ස් ට්‍රාන්සිස්ටර් රේඩියෝවක්.
67. යාර 5 ක් වූ හැට්ට රෙදි කෑලි 2 ක්.
68. කමිස 1 ක්
69. කලිසමක්.
70. සුවඳ විලවුන් බෝතලයක් සහ අත් ලේන්සුවක්.
71. පාවිච්චි කල ඇඳුම්—කෑලි 11ක් සූට් කේසය සමග.
72. බිත්තියේ එල්ලන රෙදි ආවරණයක් සහ කමිස එකක් සූට් කේසය සමග.
73 සිට 77 දක්වා; විශාල ට්‍රන්ක පෙට්ටි 5 ක්.
78. කැපිකරන ලද සුවඳ විලවුන් බහාලූ කුප්පි 10 ක්.
79. උපැස් කුට්ටම් 12 ක්.

80. අච්කණ්නාඩි 54 ක්.
81. එකක 12 බැගින් වූ නයිලෝන් කොණ්ඩ දැල් පෙට්ටි 12 ක්.
82. එකක දුසිම් 12 බැගින් වූ පීඩන ලාම්පු (ප්‍රෙෂර් ලන්ටන්) පුඩු පෙට්ටි 6 ක්.
83. එකක ග්‍රෝස් 2 බැගින් වූ පීඩන ලාම්පු ඉඳිකටු පෙට්ටි 5 ක්.
84. ඇඹිබැම් (පාටකරන) පැන්සල් 350 ක්.
85. ආගමික පින්තූර මිටි 2 ක් (පින්තූර 600 ක් පමණ.)
86. හවරි 57 ක්.
87. වාහෝ පීපි 230 ක්.
88. සෙරෙප්පු ජෝඩු 26 ක් සහ තනි සෙරෙප්පු 4 ක්.
89. වාහෝ ට්‍රන්ක් පෙට්ටියක් සමග (ඩුප්පටා) සාලු 156 ක්.
90. ට්‍රාන්සිස්ටර් 8—අංක ආර් 220 ජේ—හම් ආවරණයකින් යුතු නැෂනල් පැනසොනික් ට්‍රාන්සිස්ටර් රේඩියෝ 1 ක්.
91 සිට 93 දක්වා : "ගිලට්" ඇරිටොකට් වර්ගයට අයත්, හැඩුරු වියහැකි රැවුල් බාන උපකරණ 3 ක්.
94. "පිලිෂේවර්" වර්ගයේ විදුලි රැවුල් බාන උපකරණ 1 ක්.
95. "මීකොල්ටා" වර්ගයේ කැමරා 1 ක්.
96 සිට 97 දක්වා : නයිලෝන් ළමා කමිස 2ක්.
98. "ස්වෝන්" වර්ගයේ උල්පත් පෑන් 1 ක් (පෙට්ටියක දූ)
99. පෙට්ටියක බහාලූ උල්පත් පෑන් ප්‍රති පූරණ (රීපිල්ස්) 6 ක්.
100. කුඩා කාන්තා අත් බෑගයක්.
101. කෘතිම වළළු ජෝඩු 2 ක්.
102. හවරියක්.
103. එකක 12 බැගින් වූ රන්කරු කියත් මිටි 100 ක්.
104. නයිලෙක්ස් වර්ගයේ රෙදි කෑලි 18 ක් අඩංගු රෙදි මිටි 1 ක්, —රෙදි කෑල්ලක් යාර බාගයක් පමණ ඇති.

2. ඒ ඒ බඩු වෙන්දේසිකර හමාර වූ වහාම භාරගත් ලංසුවට ගැනෙන මුදල සම්පූර්ණයෙන් ම ගෙවූවිට බඩු ඉවත් කර ගෙන යාමට දෙනු ලැබේ.

3. කොළඹ ශ්‍රී ලංකා රේගුවේ ගාස්තු නිලධාරියාගෙන් වැඩිමනත් විස්තර ලබාගත හැක.

ජී. ඒ. ද සොයිසා,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

බිඞ/73/අගෝස්තු, වෙන්දේසිය.
1973 ජූලි මස 26 වන දින,
කොළඹ 1, ශ්‍රී ලංකා රේගුවේදී ය.

8-375—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## වෙන්දේසියේ විකිණීමයි

අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් උසාවියට අදාළව රාජසන්තක කරන ලද හා අයිතිකරුවන් විසින් රැගෙන ගොස් නොමැති බයිසිකල්, ලී දඬු, උදලු, ඉල්ලම්කූරු, ප්ලාස්ටික් භාජන, බෝතල් ආදී භාණ්ඩ වර්ග කිපයක් 73.08.25 වැනි ප.ව. 1 ට අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් උසාවි භූමියේ දී වෙන්දේසියේ විකුණනු ලැබේ.

**භාණ්ඩ මිලදී ගත් වහාම මුදල් ගෙවා, එවෙලේම එම භාණ්ඩ උසාවි භූමියෙන් ඉවත් කරගත යුතුය.**

**භාණ්ඩ ලැයිස්තුවක් 73.08.11 දින සිට අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් උසාවියේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශණය කෙරේනු ඇත. විකිණීමට නියමිත භාණ්ඩ 73.08.25 වැනි දින පෙ. ව. 11 සිට බැලිය හැක.**

ඇම්. ඩී. ද සිල්වා,
ප්‍රාදේශීය උසාවි පාලන ලේකම්.

ප්‍රාදේශීය උසාවි පාලන ලේකම් කාර්යාලය,
දිසා උසාවිය,
රත්නපුර, 1973.07.25.

8-386—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## පොලිස් යාත්‍රාව 'තම්බපාණි' වෙන්දේසියේ විකිණීම—1973 අගෝස්තු 20 වැනි ද

වම් 1973 අගෝස්තු 20 වන දින පෙරවරු 9ට පොලිස් යාත්‍රාව 'තම්බපානී' කොළඹ වරායේ නාව ජැටියේදී ප්‍රසිඛ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය අවසානයේ **එම ස්ථානයේදී මුදල් ගෙවා මෙම** යාත්‍රාව ගෙන යාමට හැකිවේ.

වෙන්දේසියට පෙර තෙදින තුළ එකී යාත්‍රාව ඉහත ස්ථානයේදී පරීක්ෂා කිරීමට ඉඩ දෙනු ලැබේ.

ඒ. සී. ලෝරන්ස්,
පොලිස් අධිකාරි, වරාය.

8-392—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## මහේස්ත්‍රාත් උසාවිය—ත්‍රිකුණාමලය

### දැන්වීමයි

කල්වේලා ඇතිව හිමිකම් ඉදිරිපත් නො කළහොත් පහත සඳහන් හිමිකරුවන් නොමැති හා රාජසන්තක කරණ ලද භාණ්ඩ 1973 අගෝස්තු මස 16 වෙනි දින ප.ව. 2.00 ට මඩකලපුවේ ප්‍රාදේශීය උසාවි පාලන ලේකම් ඉදිරිපිට **ඉහත** සඳහන් උසාවි භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

භාණ්ඩ ලබා ගැනීමට සමත් වන ඉල්ලුම් කරුවන් එම ස්ථානයේදීම මුදල් ගෙවා වහාම භාණ්ඩ ඉවත් කර ගත යුතුය.

කේ. වික්නරාජා,
මහේස්ත්‍රාත්, ත්‍රිකුණාමලය.

1973 ජූලි 30 වෙනි දින,
මහේස්ත්‍රාත් උසාවිය,
ත්‍රිකුණාමලය.

| ම.උ. ත්‍රිකුණාමලය නඩු අංකය | | භාණ්ඩ විස්තරය | |
|---|---|---|---|
| 23513 | ... | ගොනුන් දෙදෙනෙක් බඳින කරත්ත | 1 යි. |
| 23514 | ... | ගොනුන් දෙදෙනෙක් බඳින කරත්ත | 1 යි. |
| 23515 | ... | ගොනුන් දෙදෙනෙක් බඳින කරත්ත | 1 යි. |
| 23517 | ... | ගොනුන් දෙදෙනෙක් බඳින කරත්ත | 1 යි. |
| 10270 | ... | දොර රාමු | 1 යි. |
| | | ජනෙල් | 1 යි. |
| එම්/1960 | ... | බරණි | 3 යි. |
| 15491 | ... | මෝරතෙල් බෝතල් | 1 යි. |
| 21216 | ... | පාට පැන්සල් පෙට්ටි | 1 යි. |
| 15232 | ... | පාවිච්චි කරණ ලද රැලේ පාපැදි (අංකය : ටී.එජ්. 1178) | 1 යි. |
| ඒආර්/2491/72 | ... | පලුදුවූ හම්බර් පාපැදි (අංකය: ඒජී. 94140) | 1 යි. |
| ඒආර්/2670/72 | ... | පලුදුවූ රැලේ පාපැදි (අංකය : 2385) | 1 යි. |
| ඒආර්/2490/72 | ... | පලුදුවූ රජ් පාපැදි (අංකය : 34528) | 1 යි. |
| එම | ... | රජ් පාපැදි (අංකය : 56983) | 1 යි. |
| 10579 | ... | මොනරා පාපැදි (අංකය : 01594) | 1 යි. |
| 15907 | ... | රැලේ පාපැදි (අංකය : 70එච් 360) | 1 යි. |
| ඒආර්/2337/73 | ... | පාවිච්චි කරණ ලද පාපැදි (අංකය : ඩීඑම්. 375) | 1 යි. |
| 20369 | ... | පලුදුවූ රැලේ පාපැදි (අංකය : 89201) | 1 යි. |
| 10610 | ... | මොනරා පාපැදි (අංකය : ඩී. එම්. 528) | 1 යි. |
| ඒආර්/2491/72 | ... | පාපැදි රාමු (අංකය : 37122) | 1 යි. |

### විවිධ භාණ්ඩ

| | |
|---|---|
| ලොකු ටින් බැරල් | 20 යි. |
| ඩැම 8 හිස් බෝතල් | 300 යි. |
| පොරොව | 15 යි. |
| ලොකු කියත් | 5 යි. |
| උදලු | 5 යි. |
| කැති | 15 යි. |
| කුඩා කැති | 5 යි. |
| ප්ලාස්ටික් කෑන් | 5 යි. |

කේ. වික්නරාජා,
මහේස්ත්‍රාත්, ත්‍රිකුණාමලය,

1973.07.28.

8-531—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

**නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙර කෙරෙන නිත්‍යානුගත දැන්වීමයි**

කළුතර දිස්ත්‍රික්කයේ ගොඩපරගහ වත්තේ වීදාගම පදිංචි මුදලිගේ දෝන පියසිලි වන මම මෙදින සිට පුරා මාසයක් ගත වූ පසු කළුතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිඛ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් වීම පිණිය නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට සඳහා අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥ පනතේ (107 අධිකාරය) 7 වන වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ඇම්. ඩී. පියසිලි.

8-427 —73. 08. 10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙර කරන නිත්‍යානුකූල දැන්වීමයි**

හලාවත දිස්ත්‍රික්කයේ, හලාවත නගරය තුළ පුස්තකාල පාරේ අංක 7හි සිට දැනට සිංහපුර පාරේ "නිශාන්" හි පදිංචි ඇන්තනී ඉග්නේෂියස් එව්සේබියස් කෝස්තා වන මම අද දින සිට පුරා මසක් ගත වූ පසු ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන මෙන් කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව 1907 නොතාරිස් ආඥ පනතේ 7 වන වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වමි.

ඒ. ඉග්නේෂස් ඊ. කෝස්තා.

"නිශාන්", සිංහපුර පාර,
හලාවත,1973.7.7.

8-429 —73. 08. 10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

කහවේ උඩුවරගොඩ පදිංචි දේව ඩසිල්වින් ද සිල්වා වන මම නොතාරිස් ආඥපනතේ 7 වෙනි වගන්තියේ පරිදි මෙවන් සිට පුරා මසක් ගතවූ පසු ගාලු දිසාවේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් කර ගැනීම සඳහාත් නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දැනුම් දෙමි.

මෙයට,

ඩී. ඩී. ද සිල්වා.

කහව,
27.7.73.

8-430—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙර කෙරෙන නිත්‍යානුගත දැන්වීමයි**

මාතර දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුවේ තිහගොඩ නාසිම්බල පදිංචි රදම්පොල ගමගේ පියදාස වන මම මෙදින සිට පුරා මසක් ගතවූ පසු මාතර දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව වර්ෂ 1907 තේ අංක 1 දරණ නොතාරිස් ආඥ පණතේ ප්‍රකාර මෙයින් දන්වමි.

ආර්. ජී. පියදාස.

31. 7. 1973.

8-474—73.08.10 දින අංක 72 දරන ගැසට් පත්‍රය

---

**නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීම සඳහා කරන නීත්‍යානුකූල දැන්වීමයි**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැලඹ විල්ලි හත්පත්තුවේ තිරගත් දහය කෝරලේ මල්කඩුවාවේ අංක 96, සාන්ත අන්තෝනි වත්තේ පදිංචි වර්ණකුලසූරිය ඇල්ෆ්‍රෙඩ් ප්‍රනාන්දු වන මම කුරුණෑගල අධිකරණ කොට්ඨාශය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු ලෙය ඇතුළු වීම සඳහා නොතාරිස් වරුන් පිළිබඳ අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥපණතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

මෙයට

ඩබ්ලිව්. ඒ. ප්‍රනාන්දු.

96, සා. අන්තෝනි වත්ත,
මල්කඩුවාව,
කුරුණෑගල.

8-473—73.08.10 දින අංක 72 දරන ගැසට් පත්‍රය

---

**නොතාරිස්වරුන් පිළිබඳ අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරණු ලබන ඉල්ලීමයි**

මහනුවර අධිකරණ කොට්ඨාශයට අයත් නුවරඑලිය දිස්ත්‍රික්කයේ පදියපැලැල්ලේ පදිංචි යටිවැල්ලේ කෝරාල්ලාගේ නොහොත් යටිවාවල වලව්වේ රණසූර සමරදිවාකර ඒකනායක විජයරත්න බණ්ඩාර වාසල මුදියන්සෙ රාලහාමිල්ලාගේ ටිකිරිබණ්ඩා යටිවැල්ලේ වන මා ප්‍රතිඥත ලිපිකරු වශයෙන් තුන් අවුරුදු පුහුණුව අවසන් කර ඇති බැවින් නොතාරිස් වරුන් පිළිබඳ අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර ඉල්ලා රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාණන් වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරණු ලබන බව මෙයින් දන්වා සිටිමි.

මිට,

ටී. බී. යටිවැල්ලේ.

1973. 7. 25,
පදියපැලැල්ල.

8-468—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර නගරයේ අංක 33 දරණ සථානයේ පදිංචි ගිහිරින්නේ බෝදිනායක ඇල්බර්ට් ජයවර්ධන වන මම මෙදින සිට පුරා මසක් ගතවූ පසු මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයකට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥපනතේ 7 වැනි වගන්තිය යටතේ එම පනතේ 1 වැනි උප ලේඛනයේ "අ" කොටසේ 2 වැනි ව්‍යවසථාවේ ප්‍රකාර මෙයින් මහජනයාට හා රජයට දැනුම්දෙමි.

ජී. බී. ඒ. ජයවර්ධන.

දිනය: 1973 ජූලි මස 10 වැනි දින දී ය.

8-507—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ වාහන අළුත්වැඩියා කිරීම සඳහා ගරාජයන් අනුමත කිරීම.

යොමු අංකය: 3/6/992(1)

1973 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට අවුරුදු 3ක කාල සීමාවක් සඳහා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ වාහන අළුත්වැඩියා කිරීම භාර ගැනීමට කැමති, සියලුම දිස්ත්‍රික්කයන්හි පිහිටි මෝටර් ගරාජවලින් සහ ඉංජිනේරු සමාගම්වලින් අයදුම් පත් කැඳවනු ලැබේ. අයදුම් පත් (පිටපත් 3 කින් යුක්තව) ඒ ඒ දිස්ත්‍රික්ක වල දිසාපතීන් වෙත (ඉඩම් ශාඛාවන් වෙත) 1973. 9. 10 දිනට හෝ එදිනට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. කොළඹ දිස්ත්‍රික්කය තුළ තිබෙන මෝටර් ගරාජවල අයදුම්පත් කෙලින්ම, ඉඩම් කොමසාරිස්, තැ. පෙ. අංක 500, කොළඹ 1 යන ලිපිනයට 1973. 9. 10 දිනට හෝ එදිනට පෙර ලැබෙන ලෙස එවිය යුතුය. අයදුම්පත් ආකෘති පත්‍ර නිකුත් නොකරන අතර අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ආදර්ශ අයදුම් පත අනුව තම තමන්ගේ අයදුම් පත් පිළියෙල කරගත යුතුය.

කේ. ඇන්. වීරක්කොඩි,
ඉඩම් කොමසාරිස්.

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1, 1973 ජූලි මස 19.

### ආදර්ශ අයදුම් පත

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන අළුත්වැඩියා කිරීම සඳහා ගරාජ අනුමත කිරීමේ අයදුම්පත

1. සමාගමේ/අයදුම්කරුගේ නම :————.
2. දිස්ත්‍රික්කය :————.
3. තැපැල් ලිපිනය :————.
4. වැඩපොල පිහිටි ස්ථානය සහ කච්චේරියේ සිට ඇති දුර ප්‍රමාණය :————.
5. දුරකථන අංකය :————.
6. භාරගැනීමට කැමති අළුත්වැඩියාවන් මොනවාද යන වග : ————.
7. ට්‍රැක්ටර් සහ ට්‍රේලර්වලද අළුත්වැඩියාවන් භාර ගැනීමට කැමතිද යන්න :————.
8. ඔබ, ඔබ විසින් කරන ලද අළුත්වැඩියාවන් පිළිබඳ සහතික වන්නේ ද ? :————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8-394—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා රජයේ වානිජ (රෙදිපිළි) නීතිගත සංස්ථාව—සළුසල විසින් පවරා ගන්නා ලද සීමාසහිත ලංකා සළුසල කොටස් හිමියන් වෙත කෙරෙන නිවේදනයයි

1972 ජනවාරි 18 දිනැති අංක 14,993/44 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රිකාවේ පල කරන ලද දැන්වීම අනුව ශ්‍රී ලංකා රජයේ වානිජ (රෙදිපිළි) නීතිගත සංස්ථාව සළුසල වෙත පවරා ගන්නා ලද සීමාසහිත ලංකා සළුසල කොටස් දෙකට එකක් කොටසකට රු. 2 බැගින් මුදල් ගෙවීමට රජයේ ප්‍රධාන [illegible] කරු අදහස් කර ඇති බැවින් පවරා ගන්නා ලද කොටස් සඳහා මුදල් ලබා ගැනීමට 1973 අගෝස්තු 31 වැනි දින හෝ ඊට පෙර මෙහි පහත අත්සන් කරන අය වෙත ඉල්ලුම් කරන මෙන් සීමාසහිත ලංකා සළුසල පවරාගත් කොටස් හිමියන් වෙත මින් දන්වා සිටිනු ලැබේ.

සභාපති.

73. 07. 31.

8-469—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඊට අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයක් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| අගෝස්තු | 73.08.03 | සිකුරාද ... | 73.07.25 | බදාද | දවල් 12.00 |
| | 73.08.10 | සිකුරාද ... | 73.08.01 | බදාද | දවල් 12.00 |
| | 73.08.17 | සිකුරාද ... | 73.08.08 | බදාද | දවල් 12.00 |
| | 73.08.24 | සිකුරාද ... | 73.08.15 | බදාද | දවල් 12.00 |
| | 73.08.31 | සිකුරාද ... | 73.08.22 | බදාද | දවල් 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද ... | 73.08.29 | බදාද | දවල් 12.00 |
| | 73.09.14 | සිකුරාද ... | 73.09.05 | බදාද | දවල් 12.00 |
| | 73.09.21 | සිකුරාද ... | 73.09.11 | අඟහරුවාද | දවල් 12.00 |
| | 73.09.28 | සිකුරාද ... | 73.09.19 | බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.